`

තනි පුද්ගල බදුකරණය
(Individual Taxation)

ඉගෙනුම් ඵල

මෙම පරිච්ඡේදය අවසානයේදී ඔබට,

- තනි පුද්ගලයෙක් සම්බන්ධව තක්සේරුවන ආදායම ගණනය කරන ආකාරය පිළිබඳව
- තනි පුද්ගලයෙකුට අදාළ වන සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන පිළිබඳව
- පුද්ගලයෙකු හා සම්බන්ධ බදු අනුපාතයන් පිළිබඳව තනි පුද්ගලයෙකු සම්බන්ධයෙන් අදාළ වන බදු බැර හඳුනා ගැනීමට
- එමෙන්ම තනි පුද්ගලයෙකු සම්බන්ධයෙන් තක්සේරුවන ආදායම ගණනය කිරීමට, බදු වන ආදායම ගණනය කිරීමට සහ
- ගෙවිය යුතු බදු වගකීම ගණනය කිරීමට නිසි අවබෝධයක් ලබාගත හැකි වනු ඇත.

5.1 හැඳින්වීම

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව ඕනෑම පුද්ගලයෙකුට උද්ගත වන ආදායම් ප්‍රභව වන්නේ,

1. සේවා නියුක්තිය මත තක්සේරු වන ආදායම
2. ව්‍යාපාර මත තක්සේරු වන ආදායම
3. ආයෝජන මත තක්සේරු වන ආදායම
4. අනෙකුත් කටයුතු මත තක්සේරු වන ආදායම

මෙම ආදායමේ බදු කටයුතු සඳහා තක්සේරු කරන ආකාරය පිළිබඳව ඉහත දී සාකච්ඡා කර ඇත.

ඒ අනුව තනි පුද්ගලයකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද තක්සේරු කිරීම පහත ආකාරයට විස්තර කළ හැකිය.

JMC vLearning

පුද්ගලයාගේ නම :
තක්සේරු වර්ෂය :
ආදායම් බදු ගණනය

සේවා නියුක්ත ආදායම		xxx
ව්‍යාපාර ආදායම		xxx
ආයෝජන ආදායම		xxx
වෙනත් ආදායම		xxx
මුලු තක්සේරු වන ආදායම (Total Assessable Income)		**xxxx**
(-) 52 වන වගන්තිය අනුව සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන		(xxx)
බදුවන ආදායම (Taxable Income)		**xxx**
<u>**දළ ආදායම් බද්ද ගණනය**</u>		
බදුවන ආදායම x අදාල බදු අනුපාත (පළමුවන උපලේඛනය)		xxx
(-) බදු බැර (Tax Credit)		
• වාරික ගෙවීම්	(xx)	
• රඳවා ගැනීමේ බදු (WHT)	(xx)	(xxx)
ඉතිරි ගෙවිය යුතු බදු වගකීම් (Balance tax payable)		**xxxx**

ඒ අනුව තක්සේරු වන ආදායම තෙක් ගණනය කිරීම පිළිබඳ අවබෝධය අප ඉහත දී ආවරණය කර ඇත.

5.2 බදු අයවන ආදායම ගණනය

පනතේ 52 වන වගන්තියේ සඳහන් වන සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන අඩු කිරීමෙන් එම තැනැත්තාගේ බදු අයවන ආදායම ආගණනය කළ හැකිය. ඒ සඳහා මෙම සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන පිළිබඳ අවබෝධය වැදගත් වේ.

JMCvLearning

5.3 සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන - 52 වගන්තිය

5.3.1 පස්වන උපලේඛනයේ සඳහන් සහන

a) පුද්ගල බදු සහනය තක්සේරු වර්ෂයට රු. 1,800,000 කි.

b) මුලු කුලී ආදායම් තක්සේරු වන කොටස මත 25% ක දීමනාවක් (සත්‍ය අළුත් වැඩියා අඩු කර නොමැති විට)

5.3.2 පස්වන උපලේඛණයේ සඳහන් සුදුසුකම් ලබන ගෙවීම්

c) පහත කොන්දේසි සපුරන අනුමත පුන්‍ය ආයතනයකට සිදු කළ පරිත්‍යාග.

i.	අනුමත පුන්‍ය ආයතනයකට
ii.	මුදලින් කල පරිත්‍යාග
iii.	එම පුණ්‍ය ආයතනය **අවශ්‍ය තැනැත්තන්ට** ආයතනිකමය රැකවරණය සපයන විට.

පහත සීමාවන්ට යටත්ව අඩු කළ හැක.

❖	උපරිමය	රු. 75,000	යන අගයන්ගෙන් වඩා අඩු අගය
❖	මුලු තක්සේරුවන ආදායමින් 1/3	xxx	
	සත්‍ය පරිත්‍යාග වියදම	xxx	

d) පහත ආයතනයකට **<u>මුදලින් හෝ වෙනත් අයුරකින්</u>** සිදු කළ පරිත්‍යාග සීමාවකින් තොරව අඩු කළ හැකිය.

i. ශ්‍රී ලංකා රජයට
ii. විශ්ව විද්‍යාල පනතට යටත්ව පිහිට වූ උසස් අධ්‍යාපන ආයතනයකට
iii. බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයට
iv. ශ්‍රී ලංකා රජය විසින් පිහිට වූ අරමුදලකට
v. ප්‍රාදේශීය අධිකාරියක් මගින් ඇමතිවරයාගේ අනුමැතිය මත පිහිට වු අරමුදලකට
vi. පළාත් පාලන ආයතනයකට
vii. සෙවණ අරමුදලකට
viii. පළාත් සභා මගින් ඇමතිවරයාගේ අනුමැතිය මත පිහිට වූ අරමුදලකට
ix. අපි වෙනුවෙන් අපි අරමුදලට
x. ජාතික වකුගඩු අරමුදලට
xi. රාජ්‍ය සංස්ථාවක් මගින් ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කළ ලාභ

ඉහත සුදුසුකම් සපුරන ගෙවීම් හෝ සහන අඩු කළ පසු එම තැනැත්තාගේ බදු අයවන ආදායම ගණනය කළ හැකිය.

JMCvLearning

5.4 ගෙවිය යුතු බද්ද ගණනය කිරීම

බදු අයවන ආදායම මත ගෙවිය යුතු බද්ද ගණනය කිරීම සඳහා අදාල බදු අනුපාත පනතේ පළමුවන උපලේඛණවල සඳහන් වන ආකාරයට පහත දැක්වේ. ඒවා ආදාල පරිදි යොදා ගැනීමෙන් එම තැනැත්තාගේ ගෙවිය යුතු බදු වගකීම ගණන කල හැකිය.

5.4.1 පනතේ පළමු උපලේඛණයට අනුව,

- **තනි පුද්ගලයෙකුට අදාළ වන අඩු බදු අනුපාත**

  ආයෝජන වත්කම් විකිණීමේ ලාභ මත - 10% (2025/26)

  15% (on or after 02/06/2026)

- **සේවා නියුක්ති ආදායමේ සඳහන් බද්දට යටත් සේවාන්තික ලැබීම් මත,**

  සේවාන්තික ප්‍රතිලාභ මත අඩු බදු අනුපාත පහත පරිදිය.

පළමු	රු. මිලියන 10 →	0%
ඊළඟ	රු. මිලියන 10 →	6%
ඉතිරිය මත	xxxxx	12%

- ශ්‍රී ලංකාවෙන් පිටත භාවිත කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඊට පිටතදී යම් තැනැත්තෙකු වෙත සපයන ලද යම් සේවාවකින් උපයන ලද හෝ උපදවා ගන්නා ලද ලැබීම් සහ ලාභත මෙහිදී එකී සේවාවන් සඳහා වන ගෙවීම් විදේශ විනිමය ලෙස ලබාගෙන බැංකුවක් මාර්ගයෙන් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කර එවා තිබිය යුතුය. – 15%

- යම් විදේශීය මූලාශ්‍රයකින් උපයන ලද හෝ උපදවා ගන්නා ලද ලැබීම් සහ ලාභත මෙහිදී එකී ලැබීම් සහ ලාභ විදේශ විනිමයෙන් උපයා හෝ උපදවාගෙන ඇති අතරල ඒවා බැංකුවක් මාර්ගයෙන් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කර එවා තිබිය යුතුය. – 15%

- **තනි පුද්ගලයෙකුට අදාළ වැඩි බදු අනුපාත**

  ඔට්ටු ඇල්ලීමේ සහ සූදු, මත්පැන් හෝ දුම්කොළ යන ඒවායින් සමන්විත වන ව්‍යාපාරයකින් ලැබෙන ආදායම මත - 45%.

- **සාමාන්‍ය පුද්ගලයෙකුගේ ආදායම් මත සාමාන්‍ය බදු අනුපාත**

  යෝජිත බදු සංශෝධිත අනුව 2025/04/01 වන දින සිට තනි පුද්ගලයන්ට පහත අනුපාත අදාල වේ. ඒ අනුව බදුවන ආදායමේ,

  - පළමු 1,000,000 - 6%
  - ඊළඟ 500,000 - 18%
  - ඊළඟ 500,000 - 24%
  - ඊළඟ 500,000 - 30%

JMC vLearning

`

- ඉතිරිය මත xxxx - 36%

ඉහත අදාල බදු අනුපාත යොදා ගනිමින් එම තැනැත්තා ගෙවිය යුතු බදු වගකීම ගණනය කළ හැකි අතර එම වගකීම මත මෙතෙක් නිරවුල් කර ඇති බදු මුදල් වේ නම් අඩු කර ගැනීමේ අයිතිය පුද්ගලයෙකු සතු වේ. එම අයිතිය **බදු බැරක්** වශයෙන් හඳුනා ගනී.

5.5 පුද්ගලයෙකුට අදාල බදු බැර

1. ගෙවූ පුද්ගල අත්තිකාරම් බදු
2. ස්වතක්සේරු බදු ගෙවීම්
3. විදේශ බදු බැර
4. ගෙවූ රඳවාගත් බදු
5. හවුල් ව්‍යාපාර ලාභ මත ගෙවූ රඳවාගත් බදු

ඒ අනුව ගෙවිය යුතු බද්දට ඉහත සඳහන් බදු බැර තිබේනම් අඩු කිරීමෙන් (හිලව්) එම තැනැත්තාගේ ගෙවිය යුතු ඉතිරි බදු වගකීම් හෝ වැඩිපුර ගෙවූ බද්ද ගණනය කළ හැකිය.

සාරාංශය

මෙම පරිච්ඡේදය අධ්‍යයනය තුළින් ඔබට තනි පුද්ගලයකු සම්බන්ධව තක්සේරු වන ආදායම ගණනය කිරීම, බදුවන ආදායම ගණනය කිරීම එමෙන්ම දලබදු වගකීම ගණනය කිරීම තවද ඉතිරි බදු වගකීම ගණනය කිරීම පිළිබඳව මනා අවබෝධයක් ලබා ගත හැකි විය.

JMC vLearning

Lecturer:
Mr. Nuwan Sameera
ACA, ACPM, CTA(Reading), ACCA (finalist), M.Sc. in MGT SJP,
B.Sc. (Accounting) Special 1st Class SJP, CTHE (RUSL),
Lecturer at State University in Sri Lanka

`

Practice Questions

සමාලෝචන ප්‍රශ්න

1) වාසික පුද්ගලයකු වන සරත් මූල්‍ය විශේෂඥයෙකු වන අතර ශ්‍රී ලංකාවේ මූල්‍ය සමාගමක මූල්‍ය කළමනාකරු ලෙස සේවය කරයි.

   2025/26 තක්සේරු වර්ෂය (මින්මතු වර්ෂය යැයි හැඳින්වෙන) සඳහා සරත්ගේ ආදායම සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා ඇත.

   (i) සේවා නියුක්තියෙන් ලද ආදායම :

   - දළ වැටුප මසකට රු.350,000ක් බැගින්
   - 2026 ජනවාරි මස රු.250,000 ප්‍රසාද දීමනාවක් ලැබී ඇත. මෙය 2024/25 තක්සේරු වර්ෂයේදී අනුමත කර ඇත.
   - දුරකථන දීමනාව මසකට රු.15,000කි.
   - ඔහුට ආයතනය විසින් 2000 CC එන්ජින් ධාරිතාවක් සහිත වාහනයක් රියදුරු සහිතව ලබා දී ඇත.
   - ඉන්ධන දීමනාව ලෙස මසකට රු.40,000 ද ලැබෙයි.
   - ඔහු 2025 අගෝස්තු මස ආයතනය නියෝජනය කරමින් සමුළුවකට ජර්මනිය වෙත ඒම සඳහා දරන ලද ගුවන් ටිකට්පත් ගාස්තුව රු.400,000 කි.
   - වර්ෂය තුළ වෛද්‍ය බිල්පත් ගාස්තුව රු.160.000 කි. ආයතනය තුළ සියලු පූර්ණ කාලීන සේවකයින්ට සමාන ප්‍රතිලාභ ලැබෙන ක්‍රමවේදයක් අනුගමනය නොකරයි.
   - වර්ෂය සඳහා අඩුකරන ලද අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද [Advance Personal Income Tax (APIT)] රු.1,953,300 කි.

   (ii) ඔහු මූල්‍ය උපදේශන සේවා සපයන ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර වර්ෂය සඳහා ලැබීම් සහ ගෙවීම් විස්තර පහත දැක්වේ.

JMCvLearning

`

	රු.	රු.
උපදේශන සේවා ආදායම්		5,650,000
(-)ගෙවීම්		
සහායකයින්ගේ වැටුප්	760,000	
ගිණුම්කරණ ක්ෂය	250,000	
කාර්යාල වියදම්	1,250,000	
දඩ ගාස්තු	300,000	
පරිත්‍යාග	600,000	(3,160,000)
ශුද්ධ ලාභය		2,490,000

- ගිණුම්කරණ ක්ෂය 2024/25 තක්සේරු වර්ෂයේ මිලට ගත් ගිණුම්කරණ මෘදුකාංගයක් සම්බන්ධව වේ. එහි පිරිවැය රු. 2,000,000.
- දඩගාස්තු ව්‍යාපාර ලියාපදිංචිය නිසි කලට නොකිරීම මත වූ ගාස්තුවකි.
- පරිත්‍යාග අසල නිවසක දරුවෙකුට ලබාදුන් මූල්‍ය පරිත්‍යාගයක් නියෝජනය කරයි.

(iii) වර්ෂය තුළදී රු.1,350,000 ශුද්ධ පොලියක් ස්ථාවර තැන්පතු මත ලැබී ඇත.

(iv) 2026 පෙබරවාරි ඔහුට හිමි ලැයිස්තුගත සමාගමක කොටස් විකිණීමෙන් රු.600,000 ලාභයක් උපයා ඇත.

(v) තවද 2026 මාර්තු මස රු.120,000 ලාභාංශයක් ලද අතර එය වෙනත් සමාගමක ලාභාංශ වලින් ගෙවන ලද ලාභාංශ වේ.

(vi) තක්සේරු වර්ෂය තුළ ඔහු ජාතික වකුගඩු අරමුදලට රු.100,000 ක පරිත්‍යාගයක්ද, අනුමත පුණ්‍යායතනයකට රු.50,000 වටිනා අත්‍යවශ්‍ය භාණ්ඩ පරිත්‍යාගයක් ද සිදුකර ඇත.

(vii) ඔහුගේ පරම්පරාවෙන් ඔහුට ලද නිවස කුලියට දී තිබෙන අතර මාසික කුලිය රු.120,000 කි. නිවසේ වරිපනම් තක්සේරුව රු.400,000 වන අතර ඉන් (30%) ලෙස වරිපනම් සරත් විසින් ගෙවයි. මෙහිදී අදාළ පරිදි රඳවා ගැනීමේ බදු අඩුකර තිබේ.

(viii) තක්සේරු වර්ෂය සඳහා වාරික ගෙවීම් වශයෙන් ඔහු රු.500,000 ක් ගෙවා තිබේ.

ඔබ විසින් කළ යුතු දෑ :-

2025/26 තක්සේරු වර්ෂය සඳහා සරත්ගේ පහත සඳහන් දෑ තක්සේරු කරන්න.

a) බදු අය කළ හැකි ආදායම
b) ගෙවිය යුතු දළ ආදායම් බද්ධ
c) ගෙවිය යුතු ඉතිරි/වැඩිපුර ගෙවූ බද්ධ සහ
d) බදු නිදහස් ආදායම්

JMC vLearning

`

2) දසුනි මහත්මිය ප්‍රසිද්ධ මූල්‍ය ආයතනයක කළමණාකාරිනියක ලෙස සේවය කරයි. 2025/26 තක්සේරු වර්ෂයේ (මින් මතු වර්ෂය ලෙස හැදින් වේ) පහත සඳහන් ආදායම් තොරතුරු ලබාදී ඇත.

i.

- දළ වැටුප මසකට රු.400,000
- විනෝදාංශ දීමනාව මසකට රු.10,000
- දුකථන දීමනාව වර්ෂයකට රු.200,000
- යැපුම් දීමනාව මසකට රු. 5,000
- ඇය රු. 60,000 මාසික කුලික් ගෙවමින් කුලී නිවසක ජීවත්වන අතර ඒ සඳහා ආයතනය මසකට රු. 50,000 දසුනි මහත්මියට ප්‍රතිපූර්ණය කරයි.
- ඇයට පෞද්ගලික භාවිතය සඳහා කාර් රථයක් රියදුරෙකු සමග ලබා දී ඇත.
- ඇයගේ සැත්කමක් වෙනුවෙන් ගෙවූ වෛද්‍ය බිල්පත රු. 400,000 කි. වෛද්‍ය බිල්පත ප්‍රතිපූර්ණය සම්බන්ධයෙන් සියලු සේවකයන්ට සමාන ප්‍රතිපත්තියක් සමාගම අනුගමනය නොකරයි.
- APIT ගෙවීම් වර්ෂය තුල රු. 110,000

ii.

- ඇය මූල්‍ය සේවා සපයන කුඩා ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර 2026/03/31 න් අවසන් වර්ෂයට පහත තොරතුරු සපයා ඇත

(රු.000)

සේවා ආදායම	5,000
(-) වියදම්	
සේවක වැටුප්	(1,500)
ගිණුම්කරන ක්ෂය	(500)
දඩ ගාස්තු	(50)
බදු පෙර ලාභය	2,950

- 2025/26 තක්සේරු වර්ෂය සඳහා ප්‍රාග්ධන දීමනාව රු. 50.000
- ව්‍යාපාරයේ ලියාපදිංචි ගාස්තු ගෙවීම ප්‍රමාද වීම මත ප්‍රාදේශීය සභාවට රු. 50,000 ක දඩ මුදලක් ගෙවා ඇත.

iii. වර්ෂය තුල පහත පොලී ආදායම් උපයා ඇත.

- ස්ථාවර තැන්පතු පොලී රු. 360,000 (ශුද්ධ)
- විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු මත USD 1,500 ($ 1=Rs. 300)

JMCVLearning

`

iv. තවද රු. 500,000 වටිනා ශුද්ධ ලාභාංශ ආදායමක්ද වර්ෂය තුල ලැබී ඇත.

v. ඇයට අයත් නිවසක් ගාල්ල ප්‍රදේශයේ තිබෙන අතර එය මසකට රු. 150,000 කුලී වටිනාකමකට සමාගමකට කුලියට දී ඇති අතර, එහි වරිපනම් තක්සේරුව රු. 300,000 කි. 30% බැගින් කුලියට ගත් සමාගම වරිපනම් ගෙවයි. කුලියට අදාල රඳවාගැනීම් බදු නිසියාකාරව අදාල සමාගම අඩුකරගෙන තිබේ.

vi. ඇය රු. 500,000 ක් වටිනා භාණ්ඩ ගමේ පන්සලටද රු. 100,000 වටිනා පොත් පත් තම ප්‍රදේශයේ රජයේ පාසලටද පරිත්‍යාග කර ඇත.

vii. වර්ෂය තුල රු. 400,000 වාරික ලෙස බදු වාරික ගෙවා ඇත.

ඔබ විසින් 2025/26 තක්සේරු වර්ෂයට අදාලව දසුනි මහත්මියගේ පහත දෑ ගණනය කරන්න.

a) තක්සේරු කල හැකි ආදායම
b) බදු මත ආදායම
c) දළ බදු වගකීම
d) ඉතිරි ගෙවිය යතු බදු වගකීම

JMC vLearning

Lecturer:
Mr. Nuwan Sameera
ACA, ACPM, CTA(Reading), ACCA (finalist), M.Sc. in MGT SJP,
B.Sc. (Accounting) Special 1st Class SJP, CTHE (RUSL),
Lecturer at State University in Sri Lanka

ප්‍රාග්ධන ලාභ මත බද්ද (Capital Gain Tax)

Question 01

තිළිණ මහතා විසින් 2002 වර්ෂයේ රු.4,800,000 කට මිලදී ගත් ඉඩමක් 2025 ඔක්තෝම්බර් 10 වන දින රු.7,200,000 විකුණා දමන ලදී. එය ඔහුගේ සහෝදරිය විසින් මිලදී ගත් අතර එදිනට ඉඩමේ වෙළඳපොල අගය රු.8,000,000 විය. තවද 2020 වර්ෂයේ ඉඩමේ වැටක් ඉදිකිරීම සඳහා රු.150,000 වියදමක් දරන ලද අතර තවද විකුණූ අවස්ථාවේ ඉඩම පැවරීම සඳහා රු.200,000 පිරිවැයක් දරන ලදී. 2017 සැප්තැම්බර් 30 වන දිනට මෙම ඉඩමේ වෙළඳපොල අගය රු.5,800,000 විය.

ඔබ විසින් කළ යුතු දෑ :-

a) ඉහත ගණුදෙනු මත තිළිණ මහතා විසින් ගෙවිය යුතු ප්‍රාග්ධන ලාභ මත බද්ද (Capital Gains Tax) ගණනය කරන්න .
(ලකුණු (04)

b) තිළිණ මහතා විසින් බදු වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිත දිනය සඳහන් කරන්න.

Question 02

ටැක්ස්ටිකෝ (පුද්ගලික) සමාගම විසින් ඔවුන් සතු ආයෝජන දේපලක් 2025 ජුලි 16 දින රු. 26,000,000 කට විකුණූ අතර එම දේපල 2019 වසරේදී රු. 19,000,000 කට අත්පත් කරගෙන තිබූ අතර 2025 රු.1,200,000 වැයකර අළුත්වැඩියා කර තිබුණි. විකිණීමේ බ්‍රෝකර් ගාස්තුව රු. 260,000 කි.

ඔබ විසින් කළ යුතු දෑ :-

(a). මෙම ගණුදෙනුව මත ඇතිවන ප්‍රාග්ධන ලාභය (ආයෝජන වත්කම් උපලබ්ධි මත) ගණනය කරන්න.

(b). එම බදු මුදල සහ ඊට අදාල බදු වාර්තාව සැපයිය යුතු දිනය සඳහන් කරන්න.

Question 03

ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු වන **නිමල්**, 2020 මැයි මාසයේදී රුපියල් මිලියන 25 කට අක්කර 2 ක ඉඩම් කොටසක් මිලදී ගත්තේය. ඔප්පුව ලියාපදිංචි කිරීමට අදාළව ඔහුට රු. 999,000/- ක මුද්දර ගාස්තුවක් දැරීමට සිදු විය. 2026 පෙබරවාරි 01 වන දින, නිමල් මෙම ඉඩම රියල් එස්ටේට් (Real Estate) සමාගමකට රුපියල් මිලියන 30 කට අලෙවි කළ අතර, විකුණුම් මිලෙන් 5% ක මුදලක් තැරැව්කාර ගාස්තු (Brokerage fee) ලෙස ගෙවන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ :-

(a). ඉඩම අලෙවි කිරීමේදී නිමල් විසින් ගෙවිය යුතු **ප්‍රාග්ධන ලාභ බද්ද (Capital Gain Tax - CGT)** ගණනය කරන්න.

JMCvLearning

Question 04

වෘත්තියෙන් නීතිඥයෙකු වන **ඩේමියන් (Damian)**, සිය පවුල සමඟ කැනඩාවට සංක්‍රමණය වීමට සැලසුම් කරයි. ඒ අනුව, ඔහු 2025/26 තක්සේරු වර්ෂය තුළ පහත සඳහන් ප්‍රාග්ධන **ස්වභාවයේ ගනුදෙනු සිදු කර ඇත.**

වත්කම් වර්ගය	පිරිවැය (රු.)	2017.09.30 දිනට වෙළඳපොළ අගය (රු.)	විකුණුම් වටිනාකම (රු.)
2014 සිට ඉදිකර භාවිතා කරන ලද පදිංචි නිවස	9,500,000	13,200,000	16,000,000
2012 සිට සිය ව්‍යාපාරය/වෘත්තිය සඳහා භාවිතා කළ කාර්යාල ගොඩනැගිල්ල	10,500,000	12,500,000	13,000,000
2014 දී මිලදී ගෙන, **ABC Ltd.** වෙත කුලියට දී තිබූ ගොඩනැගිල්ල	18,000,000	22,500,000	26,800,000

ඔබ විසින් කළ යුතු දෑ :-

ඉහත ගනුදෙනු මත ඩේමියන් විසින් ගෙවිය යුතු ප්‍රාග්ධන ලාභ බද්ද **(Capital Gain Tax - CGT)** ගණනය කරන්න.

Lecturer:
Mr.Nuwan Sameera
ACA, ACPM, CTA(Reading), ACCA (finalist), M.Sc. in MGT SJP, B.Sc. (Accounting) Special First Class SJP, CTHE (RUSL),
Lecturer at State University in Sri Lanka

JMC vLearning